**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ

PEOPLE'S INSURANCE
EMPOWERING A RESILIENT NATION

# පුද්ගල හදිසි අනතුරු රක්ෂණය - රක්ෂණ සැලසුම් පිළිබඳ තොරතුරු ලේඛනය (IPID)

**ඔප්පු වර්ගය:** පුද්ගල හදිසි අනතුරු රක්ෂණය

**ලබා දෙනු ලබන මූලික ආවරණය:**

රක්ෂිත පුද්ගලයකුට මරණය හෝ ශාරීරික තුවාල සිදුවන්නේ ප්‍රචණ්ඩකාරී අහම්බෙන් සිදුවන බාහිර සහ දෘෂ්‍යමාන ක්‍රම නිසා නම්, සහ එය ඔප්පු උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇත්නම් රක්ෂණ සමාගම (පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී) පහත සඳහන් පරිදි ප්‍රතිලාභ ගෙවනු ඇත:

1. මරණය - ඔප්පු උපලේඛනයේ සඳහන් කර ඇති පරිදි රක්ෂිත මුදල.
2. සදාකාලික පූර්ණ අකර්මණ්‍යතාවය - ඔප්පු උපලේඛනයේ සඳහන් කර ඇති පරිදි රක්ෂිත මුදල.
3. සදාකාලික අර්ධ අකර්මණ්‍යතාවය - ඔප්පුවේ සඳහන් කර ඇති රක්ෂිත මුදලේ ප්‍රතිශතයක්.
4. සතියකට වඩා දිගු කාලයක් පවතින තාවකාලික පූර්ණ අකර්මණ්‍යතාවය - ඔප්පු උපලේඛනයේ දක්වා ඇති සතිපතා ගෙවනු ලබන වන්දි මුදල
5. සතියකට වඩා දිගු කාලයක් පවතින තාවකාලික අර්ධ අකර්මණ්‍යතාවය - ඔප්පු උපලේඛනයේ දක්වා ඇති සතිපතා ගෙවනු ලබන වන්දි මුදල

*(මූලික ආවරණය පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 02, "සදාකාලික අකර්මණ්‍යතා" වගුව බලන්න)*

**අමතර ආවරණ (අමතර වාරිකයක් ගෙවා මෙම අමතර ආවරණය ලබා ගත හැකිය):**

1. යතුරුපැදි ආවරණය - *ඔප්පුවෙහි ව්‍යතිරේක අංක 01 ඉවත් කිරීම*
2. වැඩවර්ජන, කැරලි කෝලාහල සහ මහජන කැලඹීම් - *කරුණාකර ඔප්පුවට අමුණා ඇති "පිටසන බලන්න - SRCC පිටසන - SR 07"*
3. ත්‍රස්තවාදය - *කරුණාකර ඔප්පුවට අමුණා ඇති "පිටසන බලන්න - ත්‍රස්තවාදී පිටසන - TR 13"*
4. ඔබගේ ඔප්පුවේ දක්වා ඇති පරිදි වෙනත් ඕනෑම ආවරණයක්

**ප්‍රධාන ලක්ෂණය(යන්):**

- ආවරණය ලොව පුරා පැය 24 පුරාම ක්‍රියාත්මක වේ.

**විධිවිධාන:**

1. රක්ෂණ ඔප්පුව යටතේ ගෙවිය යුතු මුළු මුදල රක්ෂිත මුදල නොඉක්මවනු ඇත - *(කරුණාකර "විධිවිධාන" කොටස යටතේ පිටු අංක 2, අයිතම් අංක 02 බලන්න)*
2. අතුරුදහන්වීම් සඳහා වන හිමිකම් ගෙවනු ලබන්නේ සුදුසු සාක්ෂි සහිතව මාස 12 කට පසුව පමණි.

**ආවරණය නොවන දේ (ව්‍යතිරේක):**

1. යතුරුපැදි (අමතර ආවරණයක් ලෙස ලබාගෙන නොමැති නම්) / ඕනෑම ආකාරයක ධාවන තරඟ (දෙපයින් හැර) / හිම හෝ අයිස් මත කරන වෘත්තීයමය ක්‍රීඩා / ලණුවක් සහ/හෝ මාර්ගෝපදේශකයෙක් භාවිතා කර කඳු නැගීම / දිය යට ක්‍රියාකාරකම් / ගුහා තරණය / අනතුරු සඳහා සුවිශේෂී අවදානමක් ඇති විනෝදාංශ ක්‍රියාකාරකම්
2. බලපත්‍ර ලබාගෙන ඇති බලශක්තියෙන් ධාවනය වන ගුවන් යානයක මගියකු ලෙස හැර, පියාසර කිරීම හෝ ඕනෑම ගුවන් ක්‍රියාකාරකමක්. මගියා යන යෙදුමට ගුවන් කාර්ය මණ්ඩලයේ කිසිදු සාමාජිකයකු හෝ ගුවන් යානය තුල හෝ ගුවන් යානය මත සේවය කරන කාර්මිකයකු අඩංගු නොවේ.
3. දරු ප්‍රසූතිය හෝ ගැබ් ගැනීම, එවැනි සිදුවීමක් අහම්බෙන් වේගවත් වී හෝ ප්‍රේරණය වී තිබිය හැකි වුවද
4. මත් පැන් පානය කර සිටීම, හිතාමතාම ස්වයං තුවාල කරගැනීම, මනුෂ්‍ය ජීවිතයක් බේරාගැනීමේ උත්සාහයක් හැර, හිතාමතාම සුවිශේෂී අනතුරකට නිරාවරණය වීම.
5. යුද්ධය
6. කැරලි කෝලාහල සහ වැඩවර්ජනය සහ ත්‍රස්තවාදය (අමතර ආවරණ වශයෙන් ලබා නොතිබේ නම්)
7. ඕනෑම සන්නද්ධ හමුදාවක රාජකාරියේ යෙදී සිටියදී සේවයේ යෙදී සිටියදී.
8. පහල වයස් සීමාවට (අවුරුදු 18) අඩු සහ ඉහල වයස් සීමාවට (අවුරුදු 65) වැඩි පුද්ගලයින්
9. අ) ඕනෑම න්‍යෂ්ටික ඉන්ධනයකින් හෝ ඕනෑම න්‍යෂ්ටික ස්ථාපනයකින් ප්‍රතික්‍රියාකාරකයකින් හෝ වෙනත් න්‍යෂ්ටික එකලස් කිරීමකින් හෝ න්‍යෂ්ටික ඉන්ධනයකින් ඇතිවන විකිරණශීලීතා අයනීකරණය හෝ දූෂණය වීම
   ආ) ඕනෑම න්‍යෂ්ටික ස්ථාපනයක, ප්‍රතික්‍රියාකාරකයකින් හෝ වෙනත් න්‍යෂ්ටික එකලස් කිරීමක හෝ එහි න්‍යෂ්ටික සංරචකයක විකිරණශීලී, විෂ සහිත පුපුරණ ද්‍රව්‍ය හෝ වෙනත් අන්තරායකර හෝ දූෂිත අන්තර්ගතය
   ඇ) පරමාණුක හෝ න්‍යෂ්ටික විකණ්ඩනය සහ/හෝ විලයනය හෝ ඒ හා සමාන ප්‍රතික්‍රියාවක් හෝ විකිරණශීලී බලයක් හෝ පදාර්ථයක් භාවිතා කරන ඕනෑම යුද අවියක්

*(වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 01 සහ 02, "ව්‍යතිරේක" බලන්න)*

**වාරික ගෙවීමේ ක්‍රමය:**

ඔප්පුව සඳහා වාරිකය සහ ඉන් අනතුරුව කෙරෙන අලුත් කිරීමකදී (ඔප්පු උපලේඛනයේ වෙනත් ආකාරයකින් සඳහන් කර නොමැති නම්) වාර්ෂිකව ගෙවිය යුතුය.

**නාමිකයන් පත්කර තිබීමේ වැදගත්කම:**

ඔප්පුව නිකුත් කරන අවස්ථාවේදීම ප්‍රතිලාභීන් නම් කිරීම අත්‍යවශ්‍ය වේ. ඔප්පු නියමයන්ට අනුව ඔප්පු කාලසීමාව තුල නාමිකයන් වෙනස් කිරීම සිදු කළ හැකිය. මෙය හිමිකමක් ගෙවීමේදී ඇතිවිය හැකි ඕනෑම ආරවුලක් ඉවත් කරයි.

**හිමිකම් ක්‍රියා පටිපාටිය සහ අවශ්‍ය ලියකියවිලි:**

1. ඔප්පුවේ සඳහන් කර ඇති කාලසීමාව තුල රක්ෂිතයා අදාල සිද්ධිය පිළිබඳව අපගේ සම්බන්ධතා මධ්‍යස්ථානය වෙත දුරකථන අංක 0112-206306 ඔස්සේ දැනුම් දිය යුතුය.

2. රක්ෂණ සමාගම විසින් හිමිකම් පෝරමය සහ අනෙකුත් අවශ්‍ය ලියකියවිලි රක්ෂිතයාගෙන් ඉල්ලා සිටිනු ඇත.

3. රක්ෂිතයා විසින් නිසි පරිදි සම්පූර්ණ කරන ලද හිමිකම් පෝරමය සහ ඉල්ලා සිටින අනෙකුත් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.
   - අවශ්‍ය වුවහොත්, රක්ෂණ සමාගම විසින් පත් කරනු ලබන වෛද්‍යවරයකුගෙන් මතය විමසිය හැක.

4. රක්ෂණ සමාගම විසින් ලිපිලේඛන පරීක්ෂාකර හිමිකම පිළිබඳ තම වගකීම තීරණය කරනු ඇත.
   - වගකීම භාරගත හැකි නම්: රක්ෂණ සමාගම විසින් අනුමත මුදල දන්වා පිරිනැමීමේ ලිපිය සහ හිමිකම පියවීම සඳහා අවශ්‍ය අනෙකුත් ලියකියවිලි ඉල්ලා අලාභ වවුචරය යවනු ඇත.
   - වගකීම භාරගත නොහැකි නම්: රක්ෂණ සමාගම විසින් හිමිකම ප්‍රතික්ෂේප කිරීමේ ලිපිය නිකුත් කරනු ඇත.

**අවශ්‍ය ලියකියවිලි:**

අ. මරණ හිමිකම

1. නිසි පරිදි සම්පූර්ණ කරන ලද හිමිකම් පෝරමය
2. මරණ සහතිකය
3. පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව සහ හදිසි මරණ පරීක්ෂණ වාර්තාව
4. පොලිස් පරීක්ෂණ වාර්තාව (අදාල වේ නම්)

ආ. සදාකාලික අකර්මණ්‍යතාවය

1. නිසි පරිදි සම්පූර්ණ කරන ලද හිමිකම් පෝරමය
2. වෛද්‍ය පරීක්ෂණ වාර්තාව
3. රෝග නිශ්චය කාඩ්පත සහ අනෙකුත් වෛද්‍ය වාර්තා
4. පොලිස් පරීක්ෂණ වාර්තාව (අදාල වේ නම්)

ඇ. තාවකාලික අකර්මණ්‍යතාවය

1. නිසි පරිදි සම්පූර්ණ කරන ලද හිමිකම් පෝරමය
2. රෝග නිශ්චය කාඩ්පත සහ අනෙකුත් වෛද්‍ය වාර්තා
3. වෛද්‍ය නිවාඩු සහතිකය
4. වෛද්‍ය නිවාඩු තහවුරු කරන සේවා යෝජකයාගේ ලිපිය

*(කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 03, "කොන්දේසි" යටතේ කරුණු අංක 05 බලන්න)*

**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ



**වංචාව:**

රක්ෂිතයා විසින් හෝ ඔහු වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන කිසියම් හිමිකම් පෑමක් කිසියම් ආකාරයකින් පදනම් විරහිත, වංචනික හෝ හිතාමතාම අතිශයෝක්තියෙන් දක්වා ඇත්නම්, හෝ එයට සාධක වශයෙන් ව්‍යාජ ප්‍රකාශ කර ඇත්නම්, මේ යටතේ කිසිදු හිමිකම් පෑමක් ගෙවනු නොලැබේ.

*(කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 03, "කොන්දේසි" යටතේ කරුණු අංක 07 බලන්න)*

**රක්ෂණ ඔප්පු හිමියාගේ වගකීම:**

**වැදගත් තොරතුරු හෙළිදරව් කිරීම පිළිබඳව ඔප්පු හිමියාගේ වගකීම**

- මිලදී ගන්නා අවස්ථාවේදී:- ඕනෑම හිමිකම් ප්‍රතික්ෂේප කිරීමක් වලක්වා ගැනීම සඳහා යෝජනාපත්‍රයේ ඉල්ලා ඇති සියලුම වැදගත් කරුණු සත්‍ය හා නිවැරදිව හෙළි කරන්න.
- ඔප්පු කාලසීමාවේදී:- අවදානම් හෝ පුද්ගලික තොරතුරුවල සිදුවන සැලකිය යුතු වෙනස්කම් පිළිබඳව රක්ෂණ සමාගම දැනුවත් කල යුතුය.

  *(කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 03, "කොන්දේසි" යටතේ කරුණු අංක 03 බලන්න)*

**හිමිකම් පෑමක් කරන විට ඔප්පු හිමියාගේ වගකීම:-**

- හිමිකම් පෑමක් කරන විට:- හිමිකම් පෝරමය සමග හිමිකම් ක්‍රියා පටිපාටියේ සඳහන් කර ඇති පරිදි අවශ්‍ය සියලුම ලියකියවිලි සහ විස්තර සපයන්න.
  *(කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 03, "කොන්දේසි" යටතේ කරුණු අංක 05 බලන්න)*
- වාරික ගෙවීම:- ඔප්පුවේ වාරික ගෙවීමේ ප්‍රතිඥාභාරයට අනුව විය යුතුය.
  *(කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 04, "කොන්දේසි" යටතේ කරුණු අංක 11 බලන්න)*

**පැමිණිලි පිළිබඳ ක්‍රියා පටිපාටිය:-**

අපි ඔබට සේවය කිරීමට කැපවී සිටින අතර ඔබගේ අදහස්/යෝජනා ලබාගැනීමට කැමැත්තෙන් සිටින්නෙමු. අපගේ සේවාවන් පිළිබඳව ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, ඔබට පහත ක්‍රම මගින් පැමිණිල්ලක් ඉදිරිපත් කල හැකිය:

- දුරකතනයෙන් - පාරිභෝගික සේවා නිලධාරි - 011 2126136
- ඊ-මේල් මගින් - pilassist@peoplesinsurance.lk
- වට්ස්ඇප් මගින් - 0716230048
- ෆැක්ස් මගින් - 011 2126109
- තැපැලෙන් - පාරිභෝගික සේවා නිලධාරි, පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී., අංක 07, හැව්ලොක් පාර, කොළඹ 05
- මාර්ගගත ක්‍රමය මගින් - පැමිණිලි ඉදිරිපත් කිරීමේ පෝරමය අපගේ වෙබ් අඩවියෙන් www.peoplesinsurance.lk ලබාගත හැකිය. කරුණාකර "පැමිණිලි" ටැබ් එක මත ක්ලික් කරන්න
- අපගේ ප්‍රධාන කාර්යාලය වෙත පැමිණීමෙන්

පැමිණිල්ලක ඉදිරිපත් කරන අවස්ථාවේදී පහත සඳහන් තොරතුරු ලබා දිය යුතුය:-

i. පැමිණිල්ල කෙටියෙන්
ii. ඔබගේ නම සහ ඔබ හා සම්බන්ධ විය හැකි තොරතුරු
iii. යොමුව: ඔප්පු අංකය / වාහන අංකය / හිමිකම් අංකය
iv. සනාථ කෙරෙන ඕනෑම ලියවිලි

පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය භාෂා ත්‍රිත්වයෙන්ම අපගේ www.peoplesinsurance.lk වෙබ් අඩවියෙන් භාගත කල හැකිය. කරුණාකර "පැමිණිලි" ටැබ් එක මත ක්ලික් කරන්න

**<u>ආරවුල් විසඳීම:-</u>**

ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක් සඳහා අප විසින් ලබා දී ඇති විසඳුම පිලිබඳව ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, පහත සඳහන් විකල්ප ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයන් භාවිතා කිරීමට ඔබට හැකියාවක් ඇත:

i. ඔබගේ ගැටළු පහත ලිපිනයට යොමු කරන්නා:-

ශ්‍රී ලංකා රක්ෂණ ඔම්බුඩ්ස්මන්
අංක 1, බෙතෙස්ඩා පෙදෙස, කොළඹ 05
info@insuranceombudsman.lk
011 2505542 / 011 250 5041

ii. බේරුම්කරණය:- ඔප්පුවේ බේරුම්කරණ වගන්තියට අනුව

iii. ඔබගේ ගැටළු පහත ලිපිනයට යොමු කරන්නා:-

අධ්‍යක්ෂ විමර්ශන
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
11 වෙනි මහල, නැගෙනහිර කුළුණ,
ලෝක වෙලඳ මධ්‍යස්ථානය,
කොළඹ 01
011 2396184-9 / 011 2335167
investigation@ircsl.gov.lk / info@ircsl.gov.lk

*(කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 04 සහ 05, "පැමිණිලි පිළිබඳ ක්‍රියා පටිපාටිය" යන කොටස බලන්න)*

**<u>මතක තබා ගත යුතු කරුණු කිහිපයක්</u>**

**<u>රක්ෂණය අවලංගු කිරීම:</u>**

රක්ෂිතයාගේ ඉල්ලීම පරිදි මෙම රක්ෂණය ඕනෑම අවස්ථාවක අවසන් කල හැකි අතර, එවැනි අවස්ථාවකදී කිසිදු හිමිකම් පෑමක් කර නොතිබීමට යටත්ව, රක්ෂණ සමාගම විසින් ඔප්පුව ක්‍රියාත්මකව පැවති කාලය සඳහා සාමාන්‍ය කෙටි කාලීන අනුපාතයක් රඳවා ගනු ඇත. රක්ෂිතයාට දැනුම් දීමෙන් පසු රක්ෂණ සමාගමේ කැමැත්ත පරිදි ඕනෑම අවස්ථාවක මෙම රක්ෂණය අවලංගු කල හැකි අතර, එවැනි අවස්ථාවකදී අවලංගු කිරීමේ දින සිට කල් ඉකුත්

නොවූ කාලය සඳහා ඉල්ලා සිටි විට වාරිකයෙන් සමානුපාතික කොටසක් ආපසු ගෙවීමට රක්ෂණ සමාගම බැඳී සිටී.

*(කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 03, "කොන්දේසි" යටතේ කරුණු අංක 08 බලන්න)*

මෙම ඔප්පුවේ නියමයන් සහ කොන්දේසි නිසි ලෙස පිලිපැදීම සහ ඉටු කිරීම, මෙම ඔප්පුව යටතේ ඕනෑම ගෙවීමක් කිරීමේ රක්ෂණ සමාගමෙහි වගකීමට පූර්ව කොන්දේසියක් වනු ඇත.

**<u>වැදගත් සටහන්:</u>**

1. රක්ෂණ සැලසුම් පිළිබඳ තොරතුරු ලේඛනය (IPID) හි අරමුණ වන්නේ මූලික ආවරණය සහ අමතර ආවරණවල (අදාල වේ නම්) සහ ඔප්පුවේ ප්‍රධාන ලක්ෂණ පිළිබඳ සාරාංශයක් ලබා දීම වන අතර එය ඔබගේ නිශ්චිත පුද්ගලික අවශ්‍යතාවන් සඳහා සකස් කරන ලද්දක් නොවන බව සලකන්න. මෙම රක්ෂණයට අදාල ඕනෑම ආකාරයක සියලු කාරණා (හිමිකම් පෑම්, නියමයන් සහ කොන්දේසි පිළිබඳ අර්ථකථන සහ නීතිමය කටයුතු වැනි එහෙත් ඒවාට පමණක් සීමා නොවූ) මෙම ලේඛනයෙහි අන්තර්ගතය අභිබවා බලපැවැත්වෙන මූලික රක්ෂණ ඔප්පුවේ නියමයන්, කොන්දේසි සහ ව්‍යතිරේක මගින් පාලනය වන බව කරුණාවෙන් සලකන්න.

**<u>වැඩිදුර තොරතුරු සඳහා:</u>**

ඔබට වැඩිදුර තොරතුරු අවශ්‍ය නම්, පහත සඳහන් මාර්ග ඔස්සේ එය ලබා ගත හැකිය:

- දුරකතනය - 0112126126
- ඊ-මේල් - pilassist@peoplesinsurance.lk
- දිවයින පුරා පිහිටි අපගේ ශාඛා කාර්යාලයන් වෙත පැමිණීමෙන්